සැ. යු. — 2015.04.30 දින පළ වූ අංක 1,913 දරන ගැසට් පත්‍රයේ I:III,II සහ III කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,914 - 2015 මැයි මස 08 වැනි සිකුරාදා - 2015.05.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 774 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 783 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 784 |

*සැ. යු.* - විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 මැයි මස 29 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

773 - B 80946— 5,302 (2015/05 )
F 1 –

# තනතුරු ඇබෑර්තු

## මොරටුව මහ නගර සභාව

මොරටුව මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | රියැදුරු II "ආ" සැහැල්ලු වාහන | 10 | PL3-2006A | රු.12,470-10x130-10x145-10x160-12x170-රු.18,860 | I. අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්වීම (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්ව තිබිය යුතු ය.)<br>II. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>III. වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.)<br>IV. අවම උස අඩි 5ක් විය යුතු ය.<br>V. දිවා කාලයේ දී හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br>VI. මාර්ගනීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br>මෙම පුරප්පාඩු සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් 03 දෙනෙකු ද බාහිර අයදුම්කරුවන්ගෙන් 07 දෙනෙකු ද බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. (සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන් නොසිටියහොත් බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.) |
| 02. | වැඩ /ක්ෂේත්‍ර කම්කරු (III ශ්‍රේණිය) | 07 | PL1-2006A | රු.11,730-10x120-10x130 -10x145-12x160-රු.17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතු ය. |
| 03. | සෞඛ්‍ය කම්කරු (III ශ්‍රේණිය) | 07 | PL1-2006A | රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතු ය. |
| 04. | ආදාහනාගාර සහායක (III ශ්‍රේණිය) | 01 | PL1-2006A | රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත් වී තිබිය යුතු ය. |

*බඳවා ගැනීමේ කොන්දේසි :-*

01. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
02. අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
03. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.
04. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
05. සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.
06. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු හෝ දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
07. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.;
02. ස්ථිර පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ ;
03. මෙම බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රජය හා බස්නාහිර පළාත් සභාව වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :-*

01. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කළ යුතු අතර අයදුම්පත් 2015.05.22 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මොරටුව " යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් හෝ අතින් ගෙනැවිත් භාර දිය හැකිය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පතේ සහ කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

02. *අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.*

* උප්පැන්න සහතිකය ;
* අධ්‍යාපන සහතික ;
* ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය ;
* මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතු ය.)

එච්. එන් එස්. අංගම්මන,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2015 අප්‍රේල් මස 22 වැනි දින,
මොරටුව මහ නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහ නගර සභාවේ .................තනතුර සඳහා අයදුම්පත***

01. මුලකුරු සමඟ නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
03. ස්ථිර ලිපිනය :————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————. දුරකථන අංකය :————.
06. උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
08. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
09. විවාහක/අවිවාහක බව :————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද ? :————.
11. අධ්‍යාපන සුදුසුකම් :————.
12. වෙනත් සුදුසුකම් :————.
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම්, ඒ පිළිබඳ විස්තර :
    (i) දැනට දරන තනතුර :————.
    (ii) අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් ද යන වග:————.
    (iii) එම තනතුරට පත්වූ දිනය :————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද ? :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම ඉල්ලුම්කරු/කාරිය වන .................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ......................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි /නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත් නිර්දේශ කර ඉදිරිපත් කරමි.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————.
තනතුර :—————.
නිල මුද්‍රාව :—————.

05-86/1

## මොරටුව මහ නගර සභාව

මොරටුව මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර (පිරිමි) පදිංචිකරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | ස්ථානභාර නිලධාරි (මෙහෙයුම්) | 01 | RS-2 රා.පරි.ච.ලේ 06/2006 (iv) අනුව | රු. 15,850-7x180-2x240 -8x320-17x375- -රු.26,525 | I. අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථය ලබා තිබිය යුතු අතර ඉන් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය; හෝ<br>II. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය, රසායන විද්‍යාව හා තවත් එක් විද්‍යා විෂයයක් ඇතුළුව විෂයයන් හයකින් අඩු වශයෙන් වාර දෙකකදීවත් සමත්ව තිබිය යුතු අතර, ඉන් විෂයයන් 05ක් එකවර එක් වතාවකදී සමත් වී තිබිය යුතුය; හා<br>III. ලන්ඩන් හා ගිනි ඉංජිනේරු ආයතනයේ ප්‍රාථමික පරීක්ෂණ සහතිකය ලබා තිබිය යුතුය; හා<br>IV. වෘත්තිමය ගිනි නිවන හමුදාවක/සේවාවක් ගිනි නිවීමේ කටයුතු පිළිබඳ වසර 10කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය. (ආයතන ප්‍රධානියා මගින් ලිඛිතව සනාථ කළ යුතුය.)<br>V. *ලිඛිත පරීක්ෂණය :*<br>විෂයය නිර්දේශය ගිනි නිවීම් පාලනය හා මෙහෙයුම් කටයුතු, ගිනි නිවීම් වාහන නඩත්තු කිරීම, ගිනි නිවීමේ පොම්ප හා උපකරණවල තාක්ෂණික දැනුම, ගිනි බිම් ක්‍රියාමාර්ග හා අදාල ගණිත ක්‍රම, විධානය හා සන්නිවේදනය, ගොඩනැගිලි හා ගිනි වැළැක්වීමේ ක්‍රම, ගොඩනැගිලිවල සවිකරන ලද උපකරණ, ගොඩනැගිලි වල ගිනි පැතිරයාමේ ක්‍රම, ගිනිපුහුණු කිරීමේ ක්‍රම හා තාක්ෂණය<br>VI. *වයස් සීමාව* - වයස අවුරුදු 25ත් 45ත් අතර විය යුතුය. |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02. | අංශ භාර ගිනි නිලධාරි | 01 | RS-2 රා.පරි.ච.ලේ 06/2006 (iv) අනුව | රු. 15,850-7x180-2x240 -8x320-17x375- -රු.26,525 | I. පළාත් රාජ්‍ය සේවයේ, ගිනි නිවීමේ කටයුතු පිළිබඳ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. මින් අවුරුදු 3 ක නොඅඩු කාල සීමාවක් තනතුරේ ස්ථිර කරනු ලැබූ මූලික ගිනි හටයෙකු වශයෙන් සතුටුදායක සේවයක් තිබිය යුතුය; *හා*<br>II. බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව හෝ බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තේම්නතුව විසින් බලය පවරන ලද ආයතනයක් විසින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත්වී තිබීම.<br>III. *වයස් සීමාව* -වයස අවුරුදු 25ත් 45ත් අතර විය යුතුය.<br>IV. *ලිඛිත පරීක්ෂණය විෂය නිර්දේශය* :- විද්‍යාව, තාක්ෂණය, අන්තරාදායක ද්‍රව්‍ය, විධානය හා නායකත්වය, ස්ථාන පාලනය හා කළමනාකරණය |
| 03. | මූලික ගිනිහට | 04 | RS-2 රා.පරි.ච.ලේ 06/2006 (iv) අනුව | රු. 15,850-7x180-2x240 -8x320-17x375- -රු.26,525 | I. රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ , රාජ්‍ය සංස්ථා සේවයේ තනතුරේ ස්ථිර කරන ලද පළමු වන පන්තියේ ගිනිහටයෙකු ලෙස අවම වශයෙන් වසර 03ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.<br>II. බස්නාහිර පළාතේ අදාළ පළාත් පාලන ආයතනය හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත් වී තිබිය යුතුය.<br>III. *වයස් සීමාව* -වයස අවුරුදු 25ත් 45ත් අතර විය යුතුය.<br>IV. *ලිඛිත පරීක්ෂණය* :- පැය 1 1/2ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.<br>*ප්‍රශ්න පත්‍රයේ විෂය ක්ෂේත්‍රය* :<br>විද්‍යාව, තාක්ෂණය, අන්තරාදායක ද්‍රව්‍ය, විධානය හා නායකත්වය |
| 04. | යාන්ත්‍රික ගිනිහට | 08 | RS-1 රා.පරි.ච.ලේ 06/2006 (iv)A අනුව | රු. 14,280-7x145-10x180 -17x240-21x175- -රු.21,175 | I. රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ , රාජ්‍ය සංස්ථා සේවයේ තනතුරේ ස්ථිර කරනු ලැබූ ගිනිහටයෙකු ලෙස අවම වශයෙන් වසර 04ක සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.<br>II. බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.<br>III. බර වාහන පැදවීම පිළිබඳ අවම වශයෙන් අවුරුදු 2ක පළපුරුද්දක් තිබිය යුතුය.<br>IV. බස්නාහිර පළාතේ, අදාළ පළාත් පාලන ආයතනයේ හෝ එම පළාත් පාලන ආයතනය විසින් බලය පවරනු ලැබූ ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා සමත් වී තිබිය යුතුය.<br>III. *වයස් සීමාව* .- වයස අවුරුදු 22 ත් 45ත් අතර විය යුතුය.<br>IV. *ලිඛිත පරීක්ෂණය* .- පැය 1ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතුය.<br>*ප්‍රශ්න පත්‍රයේ විෂය ක්ෂේත්‍රය* .- විද්‍යාව , තාක්ෂණය |

***05. පොදුවේ සියළුම අයදුම්කරුවන් වෙත තිබිය යුතු සුදුසුකම් :-***

01. අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය ;
02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට බස්නාහිර පළාත තුළ පූර්වාසන්න වසර 3ක අවම ස්ථිර පදිංචියක් තිබිය යුතුය. ;
03. යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය;
04. යම්කිසි වරදකට අධිකරණය මගින් දඬුවම් ලැබූවකු හෝ කෙදිනක හෝ උසාවියකදී වරදකරුවෙකු වී නොමැති අයෙකු හෝ රාජ්‍ය සේවයෙන් පහ කළ අයෙකු නොවිය යුතුය;
05. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයන්ට මෙහි සඳහන් වයස් සිමාවන් අදාළ නොවේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

01. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය ;
03. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, හෝ මොරටුව මහ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය. මෙම තනතුරේ සේවය බස්නාහිර පළාත තුළට සීමාවේ.
04. මෙම තනතුරුවලට බඳවා ගනු ලබන්නේ ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රතිඵල මත තෝරාගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුවය.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :-*

01. ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් ආදර්ශ අයදුම්පත්‍ර අනුව අයදුම්පත් සකස් කොට 2015.05.22 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, මොරටුව මහ නගර සභාව, මොරටුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනත් භාර දිය හැක. තව ද අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුයි. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

02. රාජ්‍ය/බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ /රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියා මගින් සහතික කර එවිය යුතුය.

03. අයදුම්පත් භාර ගැනීමෙන් අනතුරුව විභාගය පැවැත්වෙන දිනය අයදුම්කරුවන්ට පෞද්ගලිකව දැනුම් දෙනු ලැබේ. විභාගය පැවැත්වීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය නාගරික කොමසාරිස් සතුය.

04. තව ද අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ මොරටුව මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

එච්. එන්. එස්. අංගම්මන,
නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

2015ක් වූ අප්‍රේල් මස 22 වැනි දින,
මොරටුව මහ නගර සභාව,
මොරටුව දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මොරටුව මහ නගර සභාව - මොරටුව**

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහ නගර සභාවේ ..................තනතුර සඳහා අයදුම්පත*

01. *(අ)* මුලකුරු සමඟ නම :————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම :————.
02. *(අ)* උපන් දිනය හා උපන් ස්ථානය :————.
*(ආ)* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :————.
04. විවාහක/අවිවාහක බව :————.
05. ස්ථිර ලිපිනය :————.
06. දුරකථන අංකය :————.
07. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
පදිංචි ස්ථානය අයත් ග්‍රාම නිලධාරි වසම :————.
08. බස්නාහිර පළාත තුළ කාල සීමාව :————.
09. උස අඩි :————. අඟල් :————.

10. බර ඃ රාත්තල් :————.
11. අධ්‍යාපන සුදුසුකම් ඃ
    ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් අමුණන්න.
    අ.පොස. සා.පෙළ විභාගයේ වර්ෂය :————.

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| *1. ....................* | .................... | *6......................* | .................... |
| *2....................* | .................... | *7.....................* | .................... |
| *3....................* | .................... | *8.....................* | .................... |
| *4....................* | .................... | *9.....................* | .................... |
| *5....................* | .................... | *10.....................* | .................... |

12. වෘත්තීය සුදුසුකම් :————.
13. වෙනත් සුදුසුකම් :————.
14. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනක හෝ උසාවියක දී වරදකරුවෙකු වී තිබේ ද ? (වරදකරුවෙකු වී තිබේ නම් එහි ස්වභාවය හා ලද දඬුවම් පැහැදිලිව සඳහන් කරන්න) :————.
15. ඔබ රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ/සංස්ථා හෝ වෙනත් සේවාවක සේවයේ යෙදී සිට එම සේවයෙන් පහකළ හෝ ඉල්ලා අස්වී ද යන වග (එසේ නම් ඊට හේතු) :————.

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට අනාවරණය වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවත්, සහ පත්වීම ලැබීමෙන් පසු එය අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව මා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක හෝ සංස්ථාවක සේවයේ නියුතු අයදුම්කරුවන් පහත දැක්වෙන සහතිකය අයදුම්පත්‍රය සමග එවිය යුතු ය.

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................................... නමැති අයදුම්කරු ................................................. වැනි දින සිට මෙම ආයතනයේ සේවය කරන අතර, වැඩ හා හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත සඳහන් අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම ආයතනයේ සේවයෙන් මුදා හැරීම කළ හැකි බව ද දනිමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන (නිල මුද්‍රාව).

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

05-86/2

## හොරණ ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාතේ, හොරණ ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2015.05.22 වැනි දිනට හෝ එදිනට හෝ එදිනට පෙර ''ලේකම්, හොරණ ප්‍රාදේශීය සභාව, හොරණ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. හොරණ ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | වැඩ/ක්ෂෙත්‍ර කම්කරු - III ශ්‍රේණිය | 02 | PL-1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160, රු 17,600 ) (ආරම්භක පියවර) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය. |
| 02. | සෞඛ්‍ය කම්කරු - III ශ්‍රේණිය | 01 | PL-1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160, රු 17,600 (ආරම්භක පියවර) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය. |
| 03. | මුරකරු - III ශ්‍රේණිය | 01 | PL-1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160, රු 17,600 (ආරම්භක පියවර) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී ඒක වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතු වේ. |
| 04. | මුරකරු - II "ආ" | 01 | PL-3-2006A රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170, රු 18,860 (ආරම්භක පියවර) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන සාමර්ථ දෙකක් සහිතව විෂයයන් 06කින් සමත් වීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්වී තිබිය යුතු ය)<br>පෞද්ගලික/කුළී රථ සහ තාර බව හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් හා නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි.<br>වාහන රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සහිතක මගින් සනාථ කළ යුතුය) අවම උස අඩි 5ක් විය යුතු ය. දිවා කාලයේ දි හා රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. |
| 05. | පුස්තකාල උපස්ථායක - III | 01 | PL-1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160, රු 17,600 (ආරම්භක පියවර) | අධ්‍යයන පොදු සහිතක පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත් විය යුතුවේ. |
| 06. | ඖෂධ සංයෝජක - III ශ්‍රේණිය | 01 | PL-2-2006A රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170, රු 18,600 (ආරම්භක පියවර) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සමත් වීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05ක් සමත්වී තිබිය යුතු ය) |
| 07. | බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු - II ශ්‍රේණිය | 01 | PL-3-2006A රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170, රු 18,860 (12 වන පියවර) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතු ය. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 08. | ආදායම් පරීක්ෂක - III ශ්‍රේණිය | 01 | MN-1-2006A රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320, රු 22,040 (ආරම්භක පියවර) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම. |

ඉහත සඳහන් කරන ලද ඒ ඒ තනතුර සඳහා අදාළ සුදුසුකම්වලට පහත දැක්වෙන පොදු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

01. *පොදු සුදුසුකම් :-*

(i) අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය. (හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය අති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ). ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකයකින් සනාථ විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2015.05.22 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. ආදායම් පරීක්ෂක III තනතුර සඳහා අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සථිර තනතුරක නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ).

(iii) අයදුම්කරු යහපත්/විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

(v) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(vi) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් සපුරන අයෙකු විය යුතු ය.

(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්, තනතුරු සඳහා අයදුම් කිරීමේ දී, රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල/සංස්ථා සේවයෙන් පහ කරණු ලැබූවකු නොවිය යුතු ය.

02. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) බඳවාගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේ ය. ශ්‍රේණි ගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ පරීක්ෂණ කාල සීමාවකට යටත් විය යුතු ය.

(iii) ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(iv) මෙම සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත්වේ. පළාත් පාලන ආයතන තුළ ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතුවේ. තව ද පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම්, ඒ ඒ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගේ එකඟත්වය මත පළාත් පාලන කොමසාරිස් විසින් සිදු කරනු ඇත. රාජකාරී වේලාව හා රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ප්‍රධානියාට රජය පිළිගත් නීතිරීතිවලට යටත්ව තීරණය කළ හැකිවේ.

(v) මෙම බඳවාගැනීම සිදු කරණුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට ද, රජය හෝ පළාත් සභාව හෝ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව ය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම්ලාභියා බැඳී සිටිය යුතු ය.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) බඳවා ගැනීමේ පරිපාටියට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

(ii) බඳවාගැනීමේ පරිපාටීන්ට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයන් නොමැති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

04. අයදුම්කිරීමේ ක්‍රමය :-

(i) අයදුම්පත්‍ර සමග පහත සඳහන් සහතික පත්‍රවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

(1) උප්පැන්න සහතිකය.
(2) ජාතික හැඳුනුම්පතේ පිටපත.
(3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි.
(4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි.
(5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය.

(ii) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාණ කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවාගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල හොරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(iv) රියදුරු තනතුර සඳහා බඳවාගැනීමේ ක්‍රමයේදී සුදුසුකම් ලද කණිෂ්ඨ සේවකයින් අතුරින් අයදුම්පත් කැඳවා ඔවුන් ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කර ඉන් සමත්වූවන් තේරීම් කර බඳවාගැනීම හෝ අංක 24/95 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ දැක්වෙන උපදෙස් වලට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකයෙකු, පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගේ හා දෙපාර්තමේන්තු නිලධාරියෙකුගෙන්ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණතා මැනීමේ පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(v) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහල කෙලවරේ අයදුම්පත් යොමුකරණ තනතුර, *ගැසට් නිවේදනයේ* සඳහන් පරිදි පැහැදිලිව සටහන් කල යුතුය. අසම්පූර්ණ හා 04 ඡේදයේ (1) යටතේ සඳහන් සහතික වල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අනෝමා අබේසිංහ,
ලේකම්,
හොරණ ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 23 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාවේ දී ය.

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ හොරණ ප්‍රාදේශීය සභාවේ ..............................................තනතුර සඳහා ආදර්ශ අයදුම් පත්‍රය

01. (අ) මුලකුරු සමග නම :——————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————.

02. ස්ථිර ලිපිනය:——————.

03. (අ) දිස්ත්‍රික්කය:——————.
(ආ) පදිංචි ස්ථානය අයත් ග්‍රාම නිලධාරී වසම හා අංකය:——————.

04. (අ) උපන් දිනය හා ස්ථානය :——————.
(ආ) අයදුම්පත් භාර ගන්නා 2015.05.22 දිනට වයස:——————.
අවුරුදු :——————. මාස:——————. දින:——————.

05. ජාතික හැඳුනුම්පත් අංකය:——————.

06. විවාහක/අවිවාහක බව:——————.

07. බස්නාහිර පළාත් තුළ පදිංචි කාල සීමාව:——————.

08. උස අඩි:——————.

09. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාගය හා විෂයයන් සඳහන් කරන්න. ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් අමුණන්න)
අ.පො.ස. (සා.පෙ) විභාගය - වර්ෂය :——————.

| *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|
| ——————. | ——————. |
| ——————. | ——————. |
| ——————. | ——————. |
| ——————. | ——————. |

10. වෙනත් සුදුසුකම් :——————.

11. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද ? (ඔව්/නැත) ........................................ (ඔබගේ පිළිතුර පැහැදිලි අත් අකුරෙන් ලියන්න) "ඔව්" නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක් ද? :——————.

12. ඔබ රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයෙන් මීට පෙර සේවයෙන් පහකළ හෝ ඉල්ලා අස්වූ තැනැත්තෙක්ද ? (ඔව්/නැත) :——————.
(ඔබගේ පිළිතුර පැහැදිලි අත් අකුරෙන් ලියන්න).

12. ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කරුණු අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව මා සේවයෙන් පහ කල හැකි බවත් මම දනිමි.

——————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ නියුක්ත අයදුම්කරුවන් පමණක් පහත කොටස සම්පූර්ණ කර එවිය යුතුය.

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ..................................................නමැති අයදුම්කරු....................................වන දින සිට මෙම ආයතනයේ සේවය කරන බවත්. ඔහුගේ වැඩ හා හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඔහුට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකර නොමැති අතර ඉදිරියේදී විනයානුකූලව ක්‍රියාකිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු තෝරා ගනු ලැබුවහොත් වහාම මුදා හැරීම කල හැකි/නොහැකි බවද දන්වමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

දිනය : ————————.

05 - 147

---

# පළාත් පාලන නිවේදන

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

ගෝ ඝාතක ආඥාපනත (272 වැනි අධිකාරිය)

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 2015 වර්ෂය සඳහා ගව මස් වෙළඳාමක් කරගෙන යාමට ඉල්ලුම් කර ඇත. ඒ සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි වී සිටින යම් අයෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින 14ක් ඇතුළත දී මා වෙත එවිය යුතු බව ගෝ ඝාතක ආඥාපනතේ 7:2 වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ර්. එම්. අතුල නිලංග බණ්ඩාර හදගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ ලිපිනය* | *ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|
| එම්. ටී. එම්. රිල්වාන් මහතා<br>හුරිමළුව, රඹුක්කන. | හුරිමළුව,<br>රඹුක්කන | ගවමස් වෙළඳාම |

05-141

---

## අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව

වීථි නම් කිරීම

අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ නම් සඳහන් මාර්ග වීථි උපලේඛනයේ "යෝජිත නාමය" යටතේ නම් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මත කරන ලදුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය ප්‍රකාරව ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව මාර්ගය මින් ඉදිරියට යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බව මින් නිවේදනය කරමි.

සභාපති,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *මාර්ගය* | *යෝජිත මාර්ගය* |
|---|---|
| ඔලබැද්ද 3 වන හරස් පාර | කේ. පී. ධනපාල මාවත |

05-188

# විවිධ දැන්වීම්

## මහනුවර මහ නගර සභාව

ප්‍රචාරක දැන්වීම් පිළිබඳ සංශෝධිත ගාස්තු පැනවීම - 2015

1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධන) පනතේ 1985 අංක 20 දරන මහ නගර සභා සංශෝධන පනතින් වැඩිදුරටත් සංශෝධිත මහ නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) අංක 272 වගන්තියෙහි 6 (ඇ) ඡේදය යටතේ හා 2002.08.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයේ පළකර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 111 වැනි පරිච්ඡේදයේ iv වැනි කොටසේ සඳහන් පරිදි,

මහනුවර මහ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා 2014.11.25 දිනැති අංක 8(57) දරන සභා තීරණය පරිදි අයකරනු ලබන දැන්වීම් පුවරු ගාස්තු, 2015.03.27 දිනැති අංක 8(46) දරන සභා තීරණය මගින් සංශෝධනය කර සම්මත කර ඇත. පහත උපලේඛනයේ සඳහන් එම සංශෝධිත ගාස්තු ප්‍රමාණයන් 2015 වර්ෂයේ දී අය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තුෂාන්ත මහීන්ද්‍ර රත්වත්තේ,
පුරපති, මහනුවර මහ නගර සභාව.

2015 අප්‍රේල් මස 10 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංක* | *දැන්වීම් පුවරු පිළිබඳ විස්තර* | *යෝජිත* *මාස 06 දක්වා වර්ග අඩියකට රු.* | *මාස 06ට වැඩි වර්ග අඩියකට රු.* |
|---|---|---|---|
| 01 | ප්‍රචාරක දැන්වීම් පුවරු වර්ග අඩි 08 හෝ 08 ට වැඩි | | |
| | 1. විදුලිය සහිත | | |
| | එක් පැත්තක් පමණක් ඇති | 110 0 | 150 0 |
| | දෙපැත්තම ඇති | 135 0 | 200 0 |
| | 2. විදුලිය රහිත | | |
| | එක් පැත්තක් පමණක් ඇති | 60 0 | 150 0 |
| | දෙපැත්තම ඇති | 75 0 | 200 0 |
| 02 | වර්ග අඩි 08ට අඩු | | |
| | 1. විදුලිය සහිත | | |
| | එක් පැත්තක් පමණක් ඇති | 55 0 | 100 0 |
| | දෙපැත්තම ඇති | 85 0 | 150 0 |
| | 2. විදුලිය රහිත | | |
| | එක් පැත්තක් පමණක් ඇති | 45 0 | 100 0 |
| | දෙපැත්තම ඇති | 55 0 | 150 0 |

05-140

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාල අතුරු ව්‍යවස්ථා යටතේ 2015 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2015 වර්ෂයේ පෙබරවාරි මස 19 දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක ඉ-19 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2015 වර්ෂය සඳහා පනවන ලද ඒ වෙළඳ බලපත්‍ර ගාස්තු ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

එල්. එච්. සුදත් මංජුල,
සභාපති,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 19 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව,
රුවන්වැල්ල.

### යෝජනාව

2014.12.19 දිනැති අංක 1894 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) වැනි කොටසේ ඇති අන්තරාදායක ව්‍යාපාර, අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලේඛනයට වැඩිමනත් වශයෙන්, අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර ලෙස හඳුනාගත් පහත සඳහන් ව්‍යාපාර හා කර්මාන්ත සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, රුවන්වැල්ල ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ. මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2015 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

### උපලේඛනය

| *අනු. අංකය* | *1 වැනි තීරුව කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *11 වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750ට වැඩි එහෙත් රු. 1500 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500 0 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01 | තේ කඩ/කෝපි කඩ පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 02 | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03 | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04 | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05 | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06 | ලැගුම්හලක් හා රෙස්ටුරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07 | ගව පට්ටියක් හා කිරි අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 08 | මාළු වෙළෙඳාම හා ශීතකළ මාළු | 500 0 | 750 0 | 1,000 0 |
| 09 | මස් වෙළෙඳාම හා ශීත කළ මස් | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | කුකුළු හා ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11 | රස කැවිලි නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | එළවළු හා පළතුරු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13 | සිසිල් බීම නිෂ්පාදනය හා අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 14 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15 | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම : | | | |
| | ග්‍රාමීය | 300 0 | 500 0 | 750 0 |
| | නාගරික | 500 0 | 750 0 | 1,000 0 |
| 16 | සාතන මඩු පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යය සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ නම් ද නැතහොත් අනුමත කළ හෝ පිළිගෙන ඇත්තේ නම් ද අයකරනු ලබන බලපත්‍ර ගාස්තුව වන්නේ එකී ගාස්තුව අයකරනු ලබන අවුරුද්දට පෙරාතුව වූ අවුරුද්දේ ආදායම අනුව එම ආදායමෙන් 1%ක ගාස්තුවකි.

05-76

---

### මුලටියන ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 හා 150 වගන්තිවලින් සහ මුලටියන ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා වැළඳගෙන ඇති 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV(ආ) පළාත් පාලන කොටසේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව මගින් මෙම සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2014 ඔක්තෝබර් මස 23 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ අංක 10(I) දරන සභා සම්මුතිය මගින් තීරණය කර ඇති බව මෙයින්

නිවේදනය කරනු ලබන අතර එකී වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා අදාල බලපත්‍ර ගාස්තු 2015 ජූනි මස 30 වන දිනට පෙර මෙම සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

සුනිල් ඇල්ලදෙණිය,
සභාපති,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2015 අප්‍රේල් මස 22 දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු*

| | *ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 ට වැඩි නොවන රු. ශත* | *රු. 751 - රු. 1,500 දක්වා රු. ශත* | *රු. 1,500 ට වැඩි රු. ශත* |
| 01. | ලැගුම් නිවාසයක් හෝ නවාතැන්පොලක් පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 02. | හෝටලයක් පවත්වානෙග යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 03. | තේ/කෝපි කඩයක් පවත්වාගෙන යාම | 350 0 | 400 0 | 450 0 |
| 04. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 550 0 | 600 0 |
| 05. | ආපනශාලා (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 06. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 550 0 | 600 0 |
| 07. | කිරිපට්ටියක් පැවැත්වීම : | | | |
| | (1) දෙනුන් 05-10 | 400 0 | 450 0 | 500 0 |
| | (2) දෙනුන් 10-25 | 500 0 | 550 0 | 600 0 |
| 08. | කිරි වෙළෙඳාමක් පවත්වාගෙන යාම | 450 0 | 500 0 | 550 0 |
| 09. | තිරිඟු පිටිවලින් සෑදූ කෑම වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 450 0 | 500 0 |
| 10. | එළවළු හෝ පළතුරු වෙළඳාමක් පවත්වාගෙන යාම | 400 0 | 450 0 | 500 0 |
| 11. | රසකැවිලි නිපදවන ස්ථානයක් පැවැත්වීම | 450 0 | 500 0 | 550 0 |
| 12. | සරුවත් පැණිබීම වෙළඳාමක් පවත්වාගෙන යාම | 400 0 | 450 0 | 500 0 |
| 13. | මාලු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 600 0 | 700 0 |
| 14. | ශීතකළ මස් හෝ මාළු නිපදවන ස්ථානයක් පැවැත්වීම | 450 0 | 500 0 | 550 0 |
| 15. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 16. | ගවගාලක් පවත්වාගෙන යාම | 400 0 | 450 0 | 500 0 |
| 17. | පොළක් පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 18. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 19. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 450 0 | 500 0 | 550 0 |
| 20. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |

II උපලේඛනය

අප්‍රසන්න හා අන්තරායදායක වෙළඳාම

| | | | | |
|---|---|---|---|---|
| 1. | කළුගල් වලක් හෝ යාන්ත්‍රික කළුගල් මෝලක් පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 2. | කළුගල් කඩා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 550 0 | 700 0 | 950 0 |
| 3. | වී මෝලක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 950 0 |
| 4. | පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 950 0 |
| 5. | කම්මලක් පවත්වාගෙන යාම | 550 0 | 600 0 | 650 0 |
| 6. | පොල්තෙල් මෝලක්/පොල්තෙල් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 550 0 | 600 0 |
| 7. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (ඩිජිටල්) | 700 0 | 950 0 | 1,000 0 |
| 8. | අතින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 550 0 | 600 0 |
| 9. | දැව ගබඩාකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 550 0 | 700 0 | 800 0 |

| | *ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 ට වැඩි නොවන* | *රු. 751 - රු. 1500 දක්වා* | *රු. 1,500 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 10. | යාන්ත්‍රික නොවන ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම | 400 0 | 450 0 | 550 0 |
| 11. | යාන්ත්‍රික ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම | 800 0 | 950 0 | 1,000 0 |
| 12. | මෝටර් රථ ගරාජයක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 900 0 |
| 13. | මෝටර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 900 0 | 950 0 | 1,000 0 |
| 14. | යතුරු පැදි හා ත්‍රිරෝද රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 550 0 | 700 0 | 950 0 |
| 15. | එල්. පී. ගෑස් විකිණීමට ගබඩාකර ඇති ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 950 0 |
| 16. | කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික පොහොර තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 950 0 |
| 17. | කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 550 0 | 700 0 |
| 18. | මැණික් ගැරීමේ හෝ පතල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 19. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 650 0 | 800 0 |
| 20. | වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 600 0 | 700 0 | 950 0 |
| 21. | යකඩ ග්‍රිල් හා ගේට්ටු නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |
| 22. | ලෝහ නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 550 0 | 700 0 | 800 0 |
| 23. | යන්ත්‍රානුසාරයෙන් මිරිස්/තුනපහ ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 550 0 | 750 0 |
| 24. | මිරිස්, තුනපහ, කුළුබඩු පැකට්කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 650 0 |
| 25. | යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම | 550 0 | 600 0 | 700 0 |
| 26. | වඩුමඩුවක් පවත්වාගෙන යාම | 450 0 | 500 0 | 550 0 |
| 27. | ග්‍රෝස් 10ට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 700 0 | 950 0 | 1,000 0 |

05-154

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| මැයි | 2015.05.08 | සිකුරාදා | 2015.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.15 | සිකුරාදා | 2015.04.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.05.22 | සිකුරාදා | 2015.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.05.29 | සිකුරාදා | 2015.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2015.06.05 | සිකුරාදා | 2015.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.12 | සිකුරාදා | 2015.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.19 | සිකුරාදා | 2015.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.26 | සිකුරාදා | 2015.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.